# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2108/72 - 2019 පෙබරවාරි මස 02 වැනි සෙනසුරාදා - 2019.02.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

### ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් කරනු ලබන පත්කිරීම

ඌව පළාත් ආණ්ඩුකාරවර ජනාධිපති නීතිඥ මාර්ෂල් පෙරේරා වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ 154ඊ. ව්‍යවස්ථාවේ (5) අනු ව්‍යවස්ථාව යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, පහත සඳහන් පත් කිරීම කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඌව පළාතේ සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පරිවාස හා ළමා ආරක්ෂක, වනිතා කටයුතු හා සමාජ සුභසාධන කටයුතු පිළිබඳ අමාත්‍ය, ගරු අනුර රවීන්ද්‍ර විදානගමගේ මැතිතුමා,

ඌව පළාතේ මාර්ග සංවර්ධන, නිවාස, ජල සම්පාදන, වතු යටිතල පහසුකම්, සමුපකාර කටයුතු සහ ද්‍රවිඩ අධ්‍යාපන (මුස්ලිම් පාසල් හැර) පිළිබඳ අමාත්‍ය ගරු අකලන් සෙන්දිල් තොන්ඩමාන් මුත්තුවිනායගම් මැතිතුමා 2019 ජනවාරි මස 19 වන දින සිට 2019 ජනවාරි මස 22 වන දින දක්වා විදේශ ගත වන හෙයින්, 2019 ජනවාරි මස 19 වන දින සිට එතුමා නැවත ශ්‍රී ලංකාවට පැමිණෙනතෙක්, එම විෂයභාර අමාත්‍යවරයා වශයෙන් වැඩ බැලීමට.

ජනාධිපති නීතිඥ මාර්ෂල් පෙරේරා,
ඌව පළාත් ආණ්ඩුකාරවර.

2019 ජනවාරි මස 18 වැනි දින,
ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

02 - 638/1

1A - PG 4379 — 67 (2019/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ඌව පළාතේ පළාත් සභාව

### ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් කරනු ලබන පත්කිරීම

ඌව පළාත් ආණ්ඩුකාරවර ජනාධිපති නීතිඥ මාර්ෂල් පෙරේරා වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ 154ඊ. ව්‍යවස්ථාවේ (4) හා (5) අනු ව්‍යවස්ථාවන් යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, පහත සඳහන් පත් කිරීම කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

| | |
|---|---|
| ඌව පළාතේ ක්‍රීඩා හා යෞවන කටයුතු, සංචාරක, ප්‍රවාහන, සංස්කෘතික සහ පේෂ කර්මාන්ත හා කුඩා කර්මාන්ත අමාත්‍ය ගරු බාලගේ සාලිය සුමේධ ද සිල්වා මැතිතුමා, | ඌව පළාතේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන (ද්‍රවිඩ පාසල් හැර), පළාත් පාලන, විදුලිබල හා බලශක්ති, ඉදිකිරීම්, ග්‍රාමීය යටිතල පහසුකම් හා ඉඩම් අමාත්‍ය ගරු චාමර සම්පත් දසනායක මැතිතුමා 2019 ජනවාරි මස 26 වන දින සිට 2019 ජනවාරි මස 30 වන දින දක්වා විදේශ ගත වන හෙයින්, 2019 ජනවාරි මස 26 වන දින සිට එතුමා නැවත ශ්‍රී ලංකාවට පැමිණෙනතෙක්, එම විෂයභාර අමාත්‍යවරයා වශයෙන් වැඩ බැලීමට. |

ජනාධිපති නීතිඥ මාර්ෂල් පෙරේරා,
ඌව පළාත් ආණ්ඩුකාරවර.

2019 ජනවාරි මස 17 වැනි දින,
ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

02 - 638/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.